ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය,
ශ්‍රී ලංකා කොන්සල් කාර්යාලයය
ඩුබායි,

**20 08 2009**

දයාබර දෙමාපියන් වෙත,

දිර්ඝ නිවාඩුවකින් පසුව නැවත ඔබ හා එක්වන්නට ලැබීම පිළිබඳව සතුටු වෙමු. අපගේ වටිනාම සම්පත වූ අප දරුවන් මවුබිමට හිතැති යහපත් පුරවැසියන් ලෙසට රටට දායාද කිරිම සඳහා ක්‍රියාත්මක වන මෙම අධ්‍යාපන වැඩපිළිවෙල වඩාත් අර්ථවත් ලෙස ඉදිරි වසර තුළදීත් පවත්වා ගෙන යාම සඳහා ඔබ සැමගේ සහයෝගය මෙන්ම දායකත්වය බලාපොරොත්තු වෙමු.

සංස්කෘතික පාසලේ 2009/2010 නව වසරේ කටයුතු සැප්තැම්බර් මස 11 වන සිකුරාදා දින ආරම්භ විමට නියමිත වේ. දරුවන් සියළු දෙනාම සුපුරුදු පරිදි පෙ.ව. 9.00 ට පෙර පාසල වෙත රැගෙන එන්න.

සංස්කෘතික පාසලට නව සිසුන් බඳවා ගැනිම්ද සැප්තැම්බර් මස 11 සහ 25 වන සිකුරාදා දිනවලදී පමනක් සිදු කෙරේ. ඒ සඳහා 2009 අගෝස්තු 31 දිනට අවුරුදු 6 සම්පූර්ණවූ හෝ දෛනික පාසලේ 1 වසරේ හෝ ඉහල පංති වල ඉගෙනුම ලබන දරුවන් හට පමනක් අවස්ථාව ඇත. මේ පිළිබඳව ඔබ දන්නා ශ්‍රී ලාංකික හිතවතුන් වෙත දැනුම් දෙනමෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමු.

පාසලට බඳවා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය පහත දැක්වෙන අප දහම්පාසලේ වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

http://www.dhahampasala.org/

මෙම වෙබ් අඩවිය ගැන ඔබගේ අදහස් සහ යෝජනා, වෙබ් අඩවියේ ඇති “අදහස් උදහස්” ඇමුනුම හරහා අපවෙත යොමු කරන්නේනම් ඉතා අගේ කොට සලකමු.

2009 සැප්තැම්බර් මස 18 වන සිකුරාදා දින ඉද් උත්සවය පැවැත්වෙන බැවින් එම දිනයේ දහම් පාසල නොපැවැත්වෙන බව කරුණාවෙන් සලක්න්න.

මෙයට
සංවිධායක කමිටුව.